# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2006 අංක 23 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2006 අගෝස්තු මස 16 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


2006 අගෝස්තු මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ :** රු. 10.75 යි. **තැපැල් ගාස්තුව :** රු. 5.00 යි.

## 2006 අංක 23 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2006 අගෝස්තු මස 16 වන දින]

එල්. ඩී.— ඕ. 34/ 2005.

### 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:–

**1**. මේ පනත 2006 අංක 23 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත යනුවෙන් හැඳින්වේ. ලුහුඬු නාමය.

**2**. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනතේ දීර්ඝ නාමයේ "ජලජ සම්පත් හා ජලජීවී වගා කර්මාන්තය සංවර්ධනය කිරීම" යන වචන වෙනුවට "ජලජීවී වගාව, ජලජ සම්පත් සහ ජලජීවී වගා මෙහෙයුම් සංවර්ධනය කිරීම සහ කළමනාකරණය කිරීම" යන වචන ආදේශ කිරීමෙන්, ඒ දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 1998 අංක 53 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:– ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"අධ්‍යක්ෂ මණ්ඩලය.

3. අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත පැවරෙන්නේ ය:–

(අ) දේශීය ධීවර සහ ජලජීවී වගා ක්ෂේත්‍රය, විද්‍යා සහ තාක්ෂණය, කර්මාන්ත, වෙළෙඳ කටයුතු, මුදල්, පරිපාලනය හෝ නීතිය පිළිබඳ පුළුල් පළපුරුද්දක් සහ හැකියාවක් පෙන්නා ඇති අවංක තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන (මෙහි මින් මතු "පත්කළ අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂවරුන් පස් දෙනෙක්; සහ

(ආ) පහත සඳහන් නිල බලයෙන් පත්වන අධ්‍යක්ෂවරු:–

(i) ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ii) 1957 අංක 49 දරන රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ලංකා ධීවර සංස්ථාවේ සභාපතිවරයා;

(iii) 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජ්‍යායතන පනත මගින් පිහිටුවන ලද ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජ්‍යායතනයේ පාලක මණ්ඩලයේ සභාපතිවරයා;

(iv) මුදල් විෂයයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ, ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නිලධරයකු;

(v) වාරිමාර්ග විෂයයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ, ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නිලධරයකු;

(vi) මහවැලි සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ, ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නිලධරයකු;

(vii) කෘෂිකාර්මික විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ, ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නිලධරයකු; සහ

(viii) පාරිසරික සහ ස්වභාවික සම්පත් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ, ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නිලධරයකු. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ අවසානයට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

"(4) අධ්‍යක්ෂ ජනරාල්වරයාට මණ්ඩලයේ රැස්වීම්වලට පැමිණ සිටීමට සහ එවැනි රැස්වීමක් ඇමතීමට හිමිකම් තිබෙන නමුත්, එවැනි රැස්වීම්වල දී ඡන්දය පාවිච්චි කිරීමට හිමිකමක් නැත්තේ ය. ".

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :–

"(අ) රට තුළ මත්ස්‍ය නිෂ්පාදනය සහ මත්ස්‍ය පරිභෝජනය වැඩි කිරීමේ අරමුණින්, ජලජීවී වගාව, ජලජීවී වගා මෙහෙයුම් සහ නිත්‍ය සහ කාලීන ජලාශයන්හි වගාව පදනම් කරගත් ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීම;" ;

(2) ඒ වගන්තියේ (ආ) ඡේදයේ "වෙරළබඩ ජලජීවී වගාව හා සමුද්‍රීය වගාව" යන වචන වෙනුවට "කිවුල්දිය ජලජීවී වගාව, වෙරළබඩ ජලජීවී වගාව සහ සමුද්‍රීය වගාව" යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (ඉ) ඡේදයේ "ප්‍රවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම" යන වචන වෙනුවට "ප්‍රවර්ධනය කිරීම, පහසුකම් සැලසීම සහ වැඩිදියුණු කිරීම" යන වචන ආදේශ කිරීමෙන්;

(4) ඒ වගන්තියේ (ඊ), (උ) සහ (ඌ) ඡේද වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන්:–

"(ඊ) ජෛව විවිධත්වය ආරක්ෂා වන පරිදි, ජලජීවී වගාව සහ ජලජීවී වගා මෙහෙයුම් සඳහා යොදාගනු ලබන ජලජ සම්පත් සහ නිත්‍ය සහ කාලීන ජලාශයන්හි වගාව පදනම් කරගත් ධීවර කර්මාන්තය, කළමනාකරණය කිරීම, සංරක්ෂණය කිරීම සහ වැඩිදියුණු කිරීම;

(උ) ජලජ සම්පත් ආනයනකරුවකු,අපනයනකරුවකු, අලෙවිකරුවකු සපයන්නකු හා බෙදාහරින්නකු ලෙස ව්‍යාපාර කරගෙනයාම සහ ජලජීවී වගාවෙහි යෙදී සිටින තැනැත්තන්ට සහ ජලජ සම්පත් ආනයනකරුවකු, අපනයනකරුවකු, සපයන්නකු, බෙදාහරින්නකු සහ අලෙවි කරන්නකු වශයෙන් ජලජ සම්පත් සංවර්ධනය කිරීමෙහි යෙදී සිටින තැනැත්තන්ට සහාය වීම;

(ඌ) ජලජීවී වගාව සහ ජලජීවී වගා මෙහෙයුම් සහ නිත්‍ය සහ කාලීන ජලාශ තුළ වගාව පදනම් කරගත් ධීවර කර්මාන්තය, කළමනාකරණය කිරීම, සංරක්ෂණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා වූ සැලසුම් සහ වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම ;" ; සහ

(5) ඒ වගන්තියේ (එ) ඡේදය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ වගන්තියේ (අ) ඡේදයේ "පර්යේෂණ හා සම්පත් සමීක්ෂණ ආරම්භ කර පැවැත්වීම;", යන වචන වෙනුවට "පර්යේෂණ හා සම්පත් සමීක්ෂණ ආරම්භ කර පැවැත්වීමට සහ පර්යේෂණ පැවැත්වීමට සහාය වීම;" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (ඇ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :–

"(ඇ) ජලජීවී වගාව ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා වූ ජලජීවී වගා මධ්‍යස්ථාන පිහිටුවීම, පවත්වාගෙනයාම සහ කළමනාකරණය කිරීම. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**7**. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :–

"අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා.

13. (1) අභ්‍යන්තර ධීවර කටයුතු සහ ජලජීවී වගා කළමනාකරණය පිළිබඳ පුළුල් පළපුරුද්දක් සහ හැකියාවක් පෙන්නා ඇති තැනැත්තකු (මේ පනතේ "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස මණ්ඩලය විසින් පත් කළ යුතු අතර, හෙතෙම අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා ද වන්නේ ය.

(2) මණ්ඩලයේ පොදු නියමයන්ට සහ පාලනයට යටත්ව, අධිකාරියේ පරිපාලන කටයුතු නියමිත පරිදි සිදු කිරීම වෙනුවෙන් සහ මේ පනත යටතේ අධිකාරියේ බලතල සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම වෙනුවෙන්, අධ්‍යක්ෂ ජනරාල්වරයා වගකිව යුතු ය.

(3) මණ්ඩලයේ අනුමැතියට යටත්ව, අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් ස්වකීය බලතල හෝ කර්තව්‍ය කිසිවක්, ඔහු විසින් අවශ්‍ය යයි සලකන පරිදි අධිකාරියේ වෙනත් යම් සේවා නියුක්තයකුට ලිඛිතව පවරනු ලැබිය හැකි ය. බලතල හෝ කර්තව්‍යයන් පවරනු ලැබුවේ යම් සේවා නියුක්තයකු වෙත ද, ඒ සේවා නියුක්තයා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නියමයන්ට යටත්ව ඒ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය. ".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති එම ප්‍රඥප්තියේ 14අ සහ 14ආ වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය:– ප්‍රධාන ප්‍රඥප්තියට 14අ සහ 14ආ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"බලපත්‍ර දීමේ නිලධරයන් නම් කිරීම.

14අ. (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මණ්ඩලයේ අනුමැතිය ඇතිව, ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලපත්‍ර දීමේ නිලධරයන් ලෙස පත් කරනු ලැබීම පිණිස, ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරි ධුරයට නොඅඩු ධුරයක් දරන අධිකාරියේ යම් නිලධරයන්, නම් කරනු ලැබිය හැකි ය.

(2) බලපත්‍රදීමේ නිලධරයකු ලෙස පත් කළ කිසියම් නිලධරයකු විසින්, 14ආ වගන්තියේ සඳහන් බලතල ක්‍රියාත්මක කිරීමට අමතරව, ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවරනු ලැබිය හැකි යම් කාර්යය හෝ කර්තව්‍ය කිසිවක් ද, ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

බලපත්‍රදීමේ නිලධරයන්ගේ බලතල සහ කර්තව්‍යයන්.

14ආ. (1) බලපත්‍ර දීමේ නිලධරයකුට –

(අ) ජලජීවී වගා මෙහෙයුමක් ක්‍රියාත්මක කිරීමේ හෝ නියුක්ත වීමේ කාර්යය සඳහා නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් කවර හෝ වේලාවක ගෙන්වා ගැනීමට සහ විමසා පරීක්ෂා කිරීමට;

(ආ) බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තා වූ කිසියම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් සෝදිසි කිරීමට සහ පරීක්ෂා කිරීමට;

(ඈ) නිකුත් කළ බලපත්‍රයක නියමයන් හා කොන්දේසිවලට අනුව හෝ මේ පනත යටතේ හෝ 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ ඊට අදාළව සාදන ලද යම් නියෝග යටතේ හෝ, බලපත්‍රලාභියකු විසින් තබාගත යුතු සහ පවත්වාගෙන යා යුතු යයි නියම කරන ලද ලේඛන කිසිවක පිටපත් ලබා ගැනීමට;

(ඇ) මේ පනතේ හෝ 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ විධිවිධානවලට පටහැනි කිසිවක් ක්‍රියාත්මකව පවතින්නේ යයි විශ්වාස කිරීමට බලපත්‍රදීමේ නිලධරයාට සාධාරණ හේතු තිබෙන යම් ස්ථානයකට හෝ පරිශ්‍රයකට, දවසේ සියලු සාධාරණ වේලාවන්හි දී ඇතුළු වී සෝදිසි කිරීමට;

(ඉ) (ඇ) ඡේදය යටතේ සෝදිසි කරන ලද කිසියම් ස්ථානයක හෝ පරිශ්‍රයක තිබී සොයාගත් යම් මත්ස්‍යයකුගේ හෝ වෙනත් ජලජ සම්පතක කොටසක් ආදර්ශයක් ලෙස ලබා ගැනීමට;

(ඊ) කිසියම් ජලජ සම්පතක් හෝ විසිතුරු මත්ස්‍යයන් අල්ලා ගැනීමට හෝ රැස්කර ගැනීමට භාවිත කරනු ලැබ ඇති හෝ භාවිත කරනු ලැබිය හැකි බව විශ්වාස කිරීමට ඔහුට සාධක ඇති විට, ඩයිනමයිට් හෝ වෙනත් හිංසක හෝ අනතුරුකාරී ද්‍රව්‍ය ඇතුළු කිසියම් විෂ සහිත විසංඥතාවයට පත් කරන ද්‍රව්‍යක් තහනමට ගැනීමට;

(උ) මේ පනත යටතේ හෝ 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත හෝ එම පනත යටතේ සාදන ලද

නියෝග යටතේ යම් වරදක් කිරීම සඳහා හෝ ඒ සම්බන්ධයෙන් පාවිච්චි කරනු ලැබ ඇති බවට විශ්වාස කිරීමට තමාට හේතු ඇත්තා වූ, බෝට්ටුවක්, ධීවර දැලක් හෝ වෙනත් ධීවර ආම්පන්නයක් හෝ උපකරණයක්, වාහනයක් හෝ දෙයක් තහනමට ගැනීම; සහ

(ඌ) අවස්ථාවෝචිත පරිදි, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ මණ්ඩලය විසින් පවරන ලද කිසියම් කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීමට සහ ඉටුකිරීමට,

බලය ඇත.

(2) බලපත්‍ර දීමේ නිලධරයකු හට, මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්යය සහ කර්තව්‍යයන් සිදු කිරීමේ දී, ඉටුකිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී පොලිසියේ සහාය ඉල්ලා සිටිය හැකි අතර, එසේ ඉල්ලා සිටින ලද යම් සියලු සහායයන් ලබාදීම, පොලිසියේ කාර්යය වන්නේ ය. ”.

**9**. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

“(ඊ) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 43ඊ වගන්තිය සහ 57අ වගන්ති යටතේ අධිකාරිය වෙත ලැබුණු සියලු මුදල් ප්‍රමාණයන්. ” .

**10**. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති එම ප්‍රඥප්තියේ 32අ සහ 32ආ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:–

ප්‍රධාන ප්‍රඥප්තියට 32අ සහ 32ආ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"අධිකාරිය විසින් වාර්ෂික වාර්තා භාරදිය යුතු බව.

32අ. පූර්වයෙන් වූ වර්ෂය ඇතුළත බලපත්‍ර දීමේ නිලධරයන් විසින් ඉටු කරන ලද කාර්යයන්ට අදාළ වාර්තාවක්, අධිකාරිය විසින් ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්ෂිකව සැපයිය යුතු ය.

අනවසර ගොඩනැගිලි හෝ ඉදිකිරීම් කඩා ඉවත් කිරීම.

32ආ. (1) මේ පනතේ විධිවිධානවලට හෝ 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ VI වන කොටසේ විධිවිධානවලට පටහැනි වූ යම් ක්‍රියාවක් සඳහා යම් ගොඩනැගිල්ලක් හෝ වෙනත් ඉදිකිරීමක් භාවිත කරනු ලබන අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ තත් කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලිඛිතව බලය පවරනු ලබන යම් බලපත්‍ර දීමේ නිලධරයකු විසින් යවනු ලබන ලිඛිත දැන්වීමක් මගින්, එම දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයක දී හෝ එදිනට පෙර එම ක්‍රියාව සිදු කිරීම නවත්වන ලෙස, එම ක්‍රියාවෙහි යෙදී සිටින තැනැත්තාට හෝ තැනැත්තන්ට නියම කරනු ලැබිය හැකි අතර, එසේ නිශ්චිතව සඳහන් කරනු ලබන ලද එම දිනය, දැන්වීම නිකුත් කිරීමේ දිනයේ සිට දින හතකට වඩා අඩු දිනයක් නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකු හෝ තැනැත්තන් වෙත ද, එම තැනැත්තා හෝ තැනැත්තන් දැන්වීමෙහි සඳහන් කාලය තුළ දී හෝ එම දැන්වීම නිකුත් කළ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ බලපත්‍ර ලබා දීමේ නිලධරයා විසින් ප්‍රදානය කරනු ලබන යම් දීර්ඝ කරනු ලබන කාලසීමාවක් තුළ දී, එම දැන්වීමෙහි නියමයන්ට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හරින අවස්ථාවක, එම ගොඩනැගිල්ල හෝ වෙනත් ඉදිකිරීම පිහිටා ඇත්තේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක අධිකරණ බලසීමාව තුළ ද, එම මහෙස්ත්‍රාත් අධිකරණය වෙත අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ බලපත්‍ර ලබා දීමේ නිලධරයා විසින් ඉල්ලීමක් ඉදිරිපත් කරමින්, එම ගොඩගැගිල්ල හෝ වෙනත් ඉදිකිරීම කඩා බිඳ දැමීම සඳහා වූ ආඥාවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිය හැකි ය.

(3) එම කාරණය පිළිබඳව අවස්ථානුගත කරුණු අනුව උචිත යයි සලකනු ලබන විභාගයක් පැවැත්වීමෙන් අනතුරුව, මහෙස්ත්‍රාත්වරයා විසින් එම ඉල්ලීමට අදාළ ගොඩනැගිල්ල හෝ වෙනත් ඉදිකිරීම කඩා බිඳ දැමීම සඳහා වූ ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වූ ආඥාවක් එම අධිකරණයෙන් පිස්කල් වෙත නිකුත් කරනු ලැබිය යුතු අතර, එම පිස්කල් විසින් එම ආඥාව ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය සියලු පියවර වහාම ගෙන, එම ආඥාව ක්‍රියාවේ යොදවනු ලැබූ ආකාරය පිළිබඳව අධිකරණයට ලිඛිතව වාර්තා කළ යුතු ය.".

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:– ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"නියෝග. 37. (1) නියෝග සෑදිය යුතු යයි මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනත යටතේ බලය දී ඇති යම් කාරණයක් සම්බන්ධයෙන්, අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් ම සහ (1) වන උපවගන්තිය මගින් පවරන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොවන පරිදි, පහත දැක්වෙන කාරණා සියල්ල හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය:–

(අ) ජලජ මාධ්‍ය කෙරෙහි ආරක්ෂාව සැපයීමේ ආකාරය;

(ආ) අභ්‍යන්තර ජලාශයන්හි ජලජීවී වගා මෙහෙයුම් පවත්වාගෙන යාමේ ආකාරය;

(ඇ) ජලජීවී වගාවන් කළමනාකරණය කිරීම, විධිමත් කිරීම, සංරක්ෂණය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා ගතයුතු පියවර සහ පිළිපැදිය යුතු ක්‍රියා පටිපාටි;

(ඈ) සංඛ්‍යාලේඛන රැස්කිරීම සහ ධීවර කටයුතුවල අලෙවිකරණයේ හෝ ජලජීවී වගා මෙහෙයුම් සැකසීමේ නිරතව සිටින තැනැත්තන් විසින් තොරතුරු සැපයීම් කළයුතු ආකාරය; සහ

(ඉ) ජලජීවී වගාවන් සඳහා මත්ස්‍යයන් සහ වෙනත් ජලජ සම්පත් ලබාගැනීමේ කාර්යය උදෙසා හෝ ඒ සම්බන්ධයෙන් යම් විශේෂිත උපකරණ, ඇටවුම්, උපක්‍රම හෝ ද්‍රව්‍ය පාවිච්චි කිරීම තහනම් කිරීම සහ අභ්‍යන්තර ජලාශයන්හි මසුන් සහ වෙනත් ජලජ සම්පත් ලබාගැනීමේ කාලයන් සහ ක්‍රම විධිමත් කිරීම.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලැබූ දින සිට හෝ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කර ඇති යම් පසු දිනයක සිට ඒ නියෝගය ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබීමෙන් පසු පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත හැකිතාක් ඉක්මණින් ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකරනු ලැබූ යම් නියෝගයක්, එය අනුමත නොකළ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය. එහෙත් එය යටතේ කලින් කරනු ලැබූ යම් දෙයකට ඉන් හානියක් නොවිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.” .

*ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**12**. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(1) “ජලජීවී වගාව”, “ජලජීවී වගා ව්‍යවසාය ”, “ජලජ සම්පත් ”, “මත්ස්‍යයන්” , “ධීවර බෝට්ටු”, “ධීවර මෙහෙයුම්” සහ “අභ්‍යන්තර ජල ප්‍රදේශ” යන අර්ථ නිරූපණයන්ට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණයන් ඇතුළත් කිරීමෙන්:–

“ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා” යන්නෙන්, 2000 අංක 4 දරන පනතින් සංශෝධිත පරිදි වූ, 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 2 වන වගන්තිය යටතේ පත් කරන ලද ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;

"බලපත්‍ර දීමේ නිලධරයන්" යන්නෙන්, 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 40 වන වගන්තිය යටතේ, ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත්කළ නිලධරයන් අදහස් වේ ;" ;

(2) "පළාත් සභා" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණයන් එකතු කිරීමෙන් :–

"නිත්‍ය ජලාශය" යන්නෙන්, මුළු වර්ෂය පුරාම ජලය රඳවා තබා ගන්නා, මිනිසා විසින් තනන ලද ජලාශයක් අදහස් වේ ;

"කාලීන ජලාශය" යන්නෙන්, වර්ෂයේ කිසියම් කාලයක දී සම්පූර්ණයෙන්ම හිඳී යන මිනිසා විසින් තනන ලද ජලාශයක් අදහස් වේ. " .

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**13**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

ශේෂ කිරීමේ වගන්තිය.

**14**. (1) මේ පනත මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියට සිදු කරන ලද සංශෝධනවල කුමක් සඳහන් වුව ද, මේ පනත ආරම්භ වීමට නියමිත දිනයට පෙරාතුවම අධ්‍යක්ෂ මණ්ඩලයේ ධුරයන් දරන සාමාජිකයන්, මේ පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය යටතේ අලුත් අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කරන තෙක්, දිගටම එකී ධුරයන් දැරිය යුතු ය.

(2) මේ පනත මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියට සිදු කරන ලද සංශෝධනවල කුමක් සඳහන් වුව ද, මේ පනත ආරම්භ වන දිනයේ දී අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස ධුරය දරන තැනැත්තා, මේ පනතින් සංශෝධිත පරිදි ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මෙම පනත ආරම්භ වන දිනයෙන් පසුව ද දිගටම එකී ධුරය දැරිය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.